ශීර්ෂය 06 - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණයන්හි එකතු වටිනාකම රු.854,113,318 ක් වුවත්, කොමිෂන් සභාව විසින් පිළියෙල කර තිබුණු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එය රු.809,113,318 ක් ලෙස රු.45,000,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව දේපළ පිරියත හා උපකරණ සංචිත ශේෂය ද එම වටිනාකමෙන් අඩුවෙන් දැක්විණි.

(ආ) ඒසීඒ 06-මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල ආරම්භක ශේෂය රු.32,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.2 වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කළ ආදායම්

වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් කොමිෂන් සභාව විසින් එකතු කර තිබූ රු.9,534,266 ක්වූ ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස දක්වා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම් වලට එළඹීම

ඇමුණුම III බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබූ වැය විෂයයන් තුනකට අදාල රු.1,609,362 ක බැරකම් 2023 වර්ෂයේ ප්‍රතිපාදන වලින් ගෙවා තිබුණි. ඉන් එක් බැරකමක් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයේ වියදමට ගැලපීමේදී ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවීම රු.494,532 ක් විය.

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය 11 පරිච්ඡේදයේ 13.3 වගන්තිය | 2019 මාර්තු 01 දින සිට පුරප්පාඩුව පැවති කොමිෂන් සභාවේ පරිපාලන නිලධාරී තනතුර සඳහා විගණිත දිනය වූ 2023 මාර්තු 31 දින දක්වාම එනම් වසර 4ක කාලයක සිට වැඩ බැලීමේ පදනම මත වර්ෂයෙන් වර්ෂය දීර්ඝ කරමින් නිලධාරිනියක පත්කර තිබුණු අතර එම තනතුර ස්ථිරව පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. |
| (ආ). 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කොමිෂන් සභාවේ සංචිත වාහන 3ක් සම්බන්ධයෙන් පොදු 268 (අ) ආකෘතිය පිළියෙල කර නොතිබුණි. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂයේදී කොමිෂන් සභාව වෙත ලැබී තිබූ ඉල්ලීම් වලින් 2023 අප්‍රේල් 28 දින වන විට ඉල්ලීම් 1,342ක් සම්බන්ධයෙන් එක් එක් ආයතන වෙතින් තොරතුරු කැඳවා තිබුණු අතර ඉල්ලීම් 523 ක කටයුතු සිදු කරමින් පැවතුණි. 2020 සහ 2021 වර්ෂවල ලැබුණු ඉල්ලීම් වලින් පිළිවෙලින් ඉල්ලීම් 07 ක හා 11ක කටයුතු 2023 අප්‍රේල් 28 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. එසේම 2022 වර්ෂයේදී කොමිෂන් සභාව වෙත ලැබී තිබුණු ඉල්ලීම් 18,469 කින් 2023 ජනවාරි 03 දින වන විට 4,124 ක කටයුතු සිදුකිරීමට පැවතුණි.

(ආ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි 237 වන වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා, පත්කිරීමේ බලධාරියා හා අමාත්‍යාංශ ලේකම් විසින් කොමිෂන් සභාව වෙත යොමුකළ අභියාචනය කොමිෂන් සභාව වෙත ලැබී, ස්ථාන මාරු සම්බන්ධයෙන් දින 15ක් හා උසස් කිරීම් සම්බන්ධයෙන් දින 45 ක් ඇතුළත තීරණයක් කොමිෂන් සභාව විසින් ගනු ලැබිය යුතු වේ. එසේ වුවත් පරීක්ෂා කරන ලද අභියාචන ලිපිගොනු 21 න් ස්ථාන මාරු අභියාචන 07 ක් සඳහා තීරණ ලබා දීමට දින 45 සිට දින 1,504 දක්වා කාලයක් ගත කර තිබුණු අතර එක් උසස් කිරීමේ අභියාචනයක් ලැබී වසර 2 කට වැඩි කාලයක් ගතවී තිබුණද විගණිත දින වන විටත් ඒ සඳහා තීරණයක් ලබාදී නොතිබුණි. අදාල අමාත්‍යාංශ වෙතින් නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තා ලැබීම ප්‍රමාදවීම හා නියමිත පරිදි එවා නොතිබීම ඒ සඳහා හේතු වී තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

---------------------------

3.2.1 ඌන උපයෝජිත වත්කම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 පෙබරවාරි 22 දිනට විවිධ වර්ගයේ ටෝනර් හා ඩ්‍රම් 116 ක් ගබඩාවේ පැවති අතර ඉන් 17 ක් 2020 වර්ෂයට පෙර මිලදී ගත් ඒවා වූ අතර 2020, 2021, 2022 හා 2023 වර්ෂවල පිළිවෙලින් ටෝනර් හා ඩ්‍රම් 05 ක්, 12 ක්, 72 ක් හා 10 ක් වශයෙන් මිලදීගෙන තිබුණි.

(ආ) 2020 වර්ෂයට පෙර මිලදී ගෙන තිබූ වර්ග 03 කින් යුත් ටෝනර් 08 ක් භාවිතා කරන යන්ත්‍ර කොමිෂන් සභාවේ නොතිබීම හා ඉතා පැරණි යන්ත්‍ර වීම නිසා භාවිතය අවම වීම හේතුවෙන් එම ටෝනර් නිෂ්ක්‍රියව පැවතුණි.

(ඇ) 2020 ජනවාරි 01 දිනට T Brother 2150 වර්ගයේ එක් ටෝනරයක් ගබඩාවේ තිබියදී 2020 හා 2022 වර්ෂවලදී පිළිවෙලින් ටෝනර් 03 ක් හා 02 ක් මිලදී ගෙන උපයෝජනයකින් තොරව පැවති අතර Brother 2140 වර්ගයේ ඩ්‍රම් එකක් 2020 ජනවාරි 01 දිනට ගබඩාවේ පැවතියදී, 2021 වර්ෂයේ තවත් එවැනිම ඩ්‍රම් එකක් මිලදී ගෙන උපයෝජනයකින් තොරව ගබඩාවේ පැවතුණි.

3.2.2 නිෂ්ක්‍රිය වත්කම්

-----------------

කොමිෂන් සභාව සතු පිරිවැය රු.2,850,000 ක්වූ වාහනයක් 2020 ඔක්තෝබර් මාසයේ සිට විගණිත දිනය වූ 2023 මාර්තු 09 දින දක්වා ධාවනයෙන් තොරව ආයතන පරිශ්‍රයේ ගාල් කර තිබුණි.

3.2.3 වත්කම් ඌනතා හා අතිරික්තතා

--------------------------------

2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භාණ්ඩ අයිතම 16 ක ඒකක 39 ක ඌණතාවයක් හා භාණ්ඩ අයිතම 12 ක ඒකක 22 ක අතිරික්තයක් පැවතුණි.

4. මානව සම්පත් කළමනාකරණය

---

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා සත්‍ය කාර්ය මණ්ඩලය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ ලේකම් තනතුර සහ තෘතීයික මට්ටමේ තනතුරු 04 ක, ද්විතීය මට්ටමේ එක් තනතුරක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 07 ක පුරප්පාඩු 13 ක් පැවති අතර විගණිත දිනය වූ 2023 මාර්තු 31 දින වන විටත් එම පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) 2023 ජනවාරි 14 දිනට මාණ්ඩලික නිලධාරීන් 08 කගේ, කළමනාකරණ සේවා නිලධාරීන් 38 කගේ හා ප්‍රාථමික සේවා නිලධාරීන් 11 කගේ කොමිෂන් සභාවේ සේවා කාලය වසර 06 ඉක්මවා තිබුණි. ඉන් එක් කළමනාකරණ සේවා නිලධාරිනියකගේ කොමිෂන් සභා සේවා කාලය වසර 20 ඉක්මවා තිබුණි.

H.S.S.P
එච්.එස්.එස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

එච්.එස්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

**04 පරිච්ඡේදය–කාර්ය සාධන දර්ශක**

**4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | **100%- 90%** | **75%-89%** | **50%- 74%** |
| අදාල නොවේ | | | |
| | | | |

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(3) වන ව්‍යවස්ථාව මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල හා කර්තව්‍යන් ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වේ. එහි දී මෙම කාර්යාලය විසින් ඉටු කරනු ලබන කාර්යයන්හි ස්වභාවය අනුව (වෙනත් රාජ්‍ය ආයතන වෙතින් ඒ ඒ අවස්ථාවන්හි දී යොමු වන ඉල්ලීම් මත මෙම කාර්යාලයේ කාර්යයන් පදනම් වන බැවින්) නිශ්චිත කාල රාමුවකට අදාළ වන පරිදි කාර්යය සාධක දර්ශක සකස් කිරීම අපහසු වී ඇත. ඒ අනුව 2017 ජූලි 25 දිනැති 2/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ලේඛනගත කළ කාර්ය සාධන දර්ශක නොමැති බව කාරුණිකව දන්වමි.

මෙම කාර්යාලය විසින් ඉටු කරනු ලබන කාර්යයන් පහත කරුණු මත රඳා පවතින බැවින් නිශ්චිත කාර්ය සාධන දර්ශක වර්ෂය ආරම්භයේ දී සකස් කිරීම ප්‍රායෝගිකව සිදු කළ නොහැකි බව වැඩිදුරටත් දන්වමි.

i. මෙම කාර්යාලය විසින් ඉටු කරනු ලබන කාර්යයන් වෙනත් රාජ්‍ය ආයතන වෙතින් ඒ ඒ අවස්ථාවන්හි දී යොමු වන ඉල්ලීම් මත පදනම් වන බැවින් ද,
ii. එලෙස ලැබෙන ඉල්ලීම් එකිනෙකට වෙනස් විෂය පථයන් යටතේ වන බැවින් ද,
iii. එම එක් එක් ලිපිවල ධාරිතාවය එකිනෙකට වෙනස් වන බැවින් ද,
iv. ඒ අනුව එකම විෂය යටතේ වුව ද ලැබෙන ලිපියේ ධාරිතාවය / ඉල්ලීම් ස්වභාවය අනුව තීරණ ලබා දීම සඳහා ගත වන කාලය වෙනස් වන බැවින් ද,
v. එවැනි එක් එක් ඉල්ලීම් සඳහා තීරණ ලබාදීමට පහසු වන පරිදි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේ දී කළ යුතු කාර්යයන් සැමවිටම ඒකවිත්ත නොවන බැවින් ද,

**05 පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

**5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.**

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | **0%-49%** | **50%-74%** | **75%- 100%** |
| | | | | | |
| | අදාල නොවේ | | | | |
| | | | | | |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.**

තිරසර සංවර්ධන අරමුණු 17ක් වන අතර, ඒවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා සෘජුවම අදාළ නොවන නමුත්, මෙම අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් අවශ්‍ය වේ. කඩිනම් හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දායකත්වය අවශ්‍ය වනු ඇත.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් බිහි කිරීම සඳහා මෙම කොමිෂන් සභාව දායක වේ.

උක්ත තිරසර සංවර්ධන අරමුණු ඉෂ්ඨ කර ගැනීම සඳහා රාජ්‍ය සේවයේ පවත්නා ඇබෑර්තු නිසි කලට, විධිමත්ව සම්පූර්ණ කිරීම ද, නිලධාරීන්ගේ උසස්වීම් ප්‍රමාදයකින් තොරව ලබා දීම ද, රාජ්‍ය සේවයේ විනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම ද වැදගත් වේ.

ඉහත පරිදි කටයුතු කිරීමෙන් තෘප්තිමත් හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කිරීම සිදු කළ හැකි අතර, එමඟින් තිරසර සංවර්ධනඅරමුණු කරා ළඟාවීමට රාජ්‍ය නිලධාරීන්ට හැකියාව ලැබෙනු ඇත.

එසේ වුවද, ඉහත සඳහන් කළ සෑම කාර්යයක්ම මූලික වශයෙන් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලය අභිනියෝජිත නිලධාරීන් වන අමාත්‍යාංශ ලේකම්වරු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ඉටු කළ යුතුව ඇත.

ඒ අනුව තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම මෙම කොමිෂන් සභාවට සෘජුවම අදාළ කර ගැනීම ප්‍රායෝගික නොවේ.

## 06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 53 | 55 | 02* |
| තෘතීයික | 11 | 06 | 05** |
| ද්විතියික | 120 | 131 | 11*** |
| ප්‍රාථමික | 54 | 47 | 07 |

* 2023.01.10 දින වන විට අතිරික්ත නොපවතී.

** වැඩ බැලීමේ පදනම මත තනතුරු දෙකක නිලදාරීන් සේවයේ යොදවා ඇත.

*** 2023.01.18 දින වන විට අතිරික්ත සංඛ්‍යාව 01 කි.

**06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

01) 21වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාලව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැවරී තිබූ රාජකාරි කොටසක් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැවරීම හේතුවෙන් 2022.12.22 දිනැතිව තනතුරු යටපත් කිරීම.

02) ප්‍රාථමික සේවාවේ බඳවාගැනීම් නතරකර තිබීම.

**06.3** **මානව සම්පත් සංවර්ධනය**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| වැටුප් සැකසීම පිළිබඳ මෘදුකාංග පුහුණු පාඨමාලාව | 01 | දින 03 | 18 | | දේශීය | දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම |
| පශ්චාත් උපාධිය (විදේශීය) | 01 | අවු.02 | 0 | 263 | විදේශීය | දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම |
| පශ්චාත් උපාධිය (දේශීය) | 03 | අවු.01 | 325 | - | දේශීය | දැණුම සහ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම |
| දෙමළ භාෂා පාඨමාලාව (පැය 150) | 73 | මාස 07 | 113 | | දේශීය | දෙමළ භාෂාව හැසිරවීමේ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම |
| දෙමළ භාෂා පාඨමාලාව (පැය 200) | 25 | 2022.06.03 දින ආරම්භකර දේශන පවත්වාගෙන යයි | 68 | | දේශීය | දෙමළ භාෂාව හැසිරවීමේ හැකියාව වර්ධනය තුලින් කාර්යක්ෂම සේවයක් ලබාදීමට හැකිවීම |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

- පුහුණු වැඩසටහන් මගින් නිලධාරීන්ගේ දැනුම කුසලතා ආකල්ප සංවර්ධනය තුලින් නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම හරහා ආයතනයේ කාර්ය සාධනය වැඩිදියුණුවේ.

**07 පරිච්ඡේදය–අනුකූලතා වාර්තාව**

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූලවේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූලවේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තුකිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනයයාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූලවේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීමපිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූලවේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතලපවරාදී තිබීම | අනුකූලවේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයටයටත්ව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| **04** | **වාර්ෂික සැලසුම්සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූලවේ | | |
| **05** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූලවේ | | |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී | | | |

| | | | | |
|---|---|---|---|---|
| | විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූලවේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූලවේ | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම | අනුකූලවේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූලවේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූලවේ | | |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූලවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූලවේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූලවේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අදාල නොවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූලවේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූලවේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූලවේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූලවේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්රකාරව කටයුතු කර තිබීම. | අනුකූලවේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූලවේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූලවේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූලවේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූලවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූලවේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූලවේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරතිබීම | අනුකූලවේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනාපල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූලවේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූලවේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූලවේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූලවේ | රජයේ වියදම් පාලනය කිරීමට නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ 3/2022 දරන චක්‍රලේඛයට අනුගතව ක්‍රියා කිරීම මත 2022 වසර සඳහා මානව සම්පත් සංවර්ධනය උදෙසා සැලැස්මක් නිර්මාණය නොකරන ලදී. එසේ වුවද සේවා ව්‍යවස්ථාවල සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරගැනීම සඳහා වන පුහුණු අවශ්‍යතා වෙනුවෙන් නිලධාරීන් ගේ ඉල්ලීම් අනුව ඒ ඒ පාඨමාලාවන් සම්පූර්ණ කරගැනීම සඳහා අදාල නිලධාරීන්ට අවස්ථාව ලබාදී ඇත. | ප්‍රතිපත්තිමය තීරණ මත රජයේ වියදම් පාලනය සඳහා නිකුත්කර ඇති චක්‍රලේඛ යටතේ නිලධාරීන් පුහුණුව පිළිද ඉදිරිපත් කරනු ලබන නියමයන්ට අනුව ක්‍රියාකිරීම. |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූලවේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූලවේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූලවේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූලවේ | | |

**අවසානය.**